# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/22 - 2010 මාර්තු 03 වැනි බදාදා - 2010.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

64 (1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 64 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා වන මම, ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63(1) වැනි වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධිවිධාන මෙම නියමය මගින් මෙහි උපලේඛනයේ ඇතුළත් කරමි.

අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2010 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 34,
නාවල, නාරාහේන්පිට පාර,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

61 (1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ :

(අ) පහත දැක්වෙන සියලුම චංචල හා නිශ්චල දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය වෙත සතු කළ යුතු ය. එනම්,

(i) ගලේවෙල ප්‍රාදේශීය සභාව යටතේ ඇති ජල සම්පාදන ක්‍රමයන්ට අයත් සියලුම ජල මූලාශ්‍ර, සේවා ජලාශ, ජල පවිත්‍රාගාර, හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම ඉඩම්, ගොඩනැගිලි, ජල නල, සියලුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවි කිරීම් ද, ඒ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය,

(ii) මෙම ජල සම්පාදන ක්‍රමයන් තුළ පිහිටි ජල බෙදාහැරීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය ජලනල මාර්ගවල පරවශතාවයන්, අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය සමග සියලුම ප්‍රධාන ජලනල බෙදාහැරීමේ ජල නල මාර්ග.

(ආ) ඉහත සඳහන් දේපළ හා සම්බන්ධ සැළසුම් කිරීම්, සවිකිරීම්, ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තු ද සභාවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරනු ලැබේ.

1A - G 12543— 350 (2010/03)

(ඈ) ජලය භාවිතා කිරීම හා ජල සේවා සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයන් සමග ගලේවෙල ප්‍රාදේශීය සභාව බැඳී ඇති සියලුම ගිවිසුම් ද, ඒ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් කළ යුතු ගෙවීම් ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 12,25,000.00ක් (දොළොස් ලක්ෂ විසිපන් දහසයි) වටිනා මේ පහසුකම්වල වත්කම්, ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ඇතුළත් වූ සියලුම ගිවිසුම් මණ්ඩලය විසින් නොකඩවා පවත්වාගෙන යනු ලබන අතර, ගිවිසුම් සපුරාලීම ද කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

03-640

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.